**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව - 2020**

**--------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට පවතින දේපළ, පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය සංචිත හා වෙන් කිරීමේ ගිණුමට මාරු කර නව දේපළ, පිරියත හා උපකරණ වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 අවසන් වර්ෂය සඳහා නව ගිණුම් ප්‍රමිත යටතේ අවසන් ගිණුම් සකස් කර ඇති අතර 2019 ට අදාළ නිවැරදි කිරීම් 2021 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කරමි. | සියළුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂය තුලදී රු.476,491 ක් වටිනා පුස්තකාල පොත් මිලදීගෙන තිබු අතර පෙර වර්ෂවල මිලදී ගත් පොත් ද සමඟ වටිනාකම දක්වා පුස්තකාල පොත් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම ගණනය කර 2021 වර්ෂයේදී ගිණුම් ගත කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කිරීමේදී වාර්ෂික ක්ෂය නිවැරදිව ගැළපුම් කර නොමැති බැවින් මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම නිවැරදි නොවේ. | 2021 වර්ෂයේ ගිණුම්ගත කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.7,633,946 ක් ලබාදීම සඳහා ව්‍යපෘති 05 ක් අනුමත කර තිබුණ අතර සභාව විසින් එම ව්‍යපෘති ක්‍රියාත්මක කර ලැබිය යුතු මුදල් ලෙස රු.6,984,823 ක් දක්වා තිබුණද එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දක්වා නොතිබුණි. | 2020 ගිණුම් සකස් කරන කාලය තුළ කොරෝනා වසංගත තත්වය නිසා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර සිදුකළ වියදම් හඳුනා ගැනීමට නොහැකි වූ නිසා මෙම වරද සිදු වී ඇත. 2021 ගිණුම් සකස් කිරීමේදී තොරතුරු ලබා ගෙන සොයා බලා නිවැරදිව ගිණුම් තබන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ කසළ ඉවත් කිරීම වෙනුවෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ගෙවා ඇති මුදල රු.36,784,996 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම වියදම රු.39,157,178 ක් වූයෙන් වියදම රු.2,372,182 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් සකස් කරන දින වන විට බිල්පත් ඉදිරිපත් නොවූ නිසා වැඩියෙන් ණයහිමියන් වෙන් කර ඇත. 2021 වර්ෂයේ ගිණුම් වල දී නිවැරදිව ගිණුම්ගත කරන බව දන්වමි. | වර්ෂයේ වියදම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ආරක්ෂක සේවා වියදම රු.1,750,924 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් සකස් කරන දින වන විට බිල්පත් ඉදිරිපත් නොවූ නිසා වැඩියෙන් ණයහිමියන් වෙන් කර ඇත. 2021 වර්ෂයේ ගිණුම් වල දී නිවැරදිව ගිණුම්ගත කරන බව දන්වමි. | වර්ෂයේ වියදම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.355,747,136 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.284,365,691 ක් විය.

2. 2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු | | |
| | 2020 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු අයකළ හැකි දේපළ 86000 ක් පමණ පැවති අතර ඉන් දේපළ 42622 ක රු.430,760,901 ක වරිපනම් හිඟයක් පැවතුණි. | කෝවිඩ් 19 පළමු හා දෙවන රැල්ලේ ව්‍යාප්තිය මත නැවතත් රට වසා දැමීම හේතුවෙන් ව්‍යාපාර කටයුතු ඇණ හිටීම නිසා වරිපනම් බදු ගෙවීම සැලකිය යුතු මට්ටමකින් අඩු විය. තව ද මේ හේතුවෙන් ව්‍යාපාර වල හිඟ වරිපනම් බදු ශේෂය රු.100,000 ඉක්මවූ හිඟ දේපළ ලැයිස්තුවට එකතු විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | කසළ බදු | | |
| | සභාව විසින් කසළ ඉවත්කරනු ලබන ව්‍යාපාරික ස්ථාන සමඟ ගිවිසුම්ගත වී නොමැති බැවින් හිඟ කසළ බදු අයකිරීමේදී නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. එසේම, 2003 නොවැම්බර් 18 දිනැති අංක 08(10)35 දරන සභා තීරණය හා මුදල් කාරක සභාවේ උපදෙස් පරිදි හිඟ කසළ | අයවිය යුතු හිඟ ආදායම අයකර ගැනීම සඳහා හිඟ ගාස්තු ලිපි යොමුකර ඇති අතර, අදාළ කොට්ඨාශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක හා සෞඛ්‍ය පරිපාලක හරහා එක් එක් ව්‍යාපාරික ස්ථාන දැනුවත් කිරීම් කරන ලද අතර ගාස්තු ගෙවීම් සිදු කරන තෙක් සේවා සැපයීම ද අත්හිටුවා ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | බදු අයකිරීමට කටයුතු නොකිරීම නිසා 2020 දෙසැම්බර් 31 දිනට හිඟ කසළ බදු ආදායම රු.17,079,650 ක් පැවතුණි. | | |
| (ඇ) | වෙනත් බදු<br>------------- | | |
| | 2020 දෙසැම්බර් 31 දිනට හිඟ කේබල් ටීවී ආදායම රු.4,718,601 ක් දැන්වීම් පුවරු හිඟ ශේෂය රු.9,960,842 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් අය කර ගැනීමට ලිපි යවා ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | කඩකුලී<br>---------- | | |
| i | රත්මලාන නව පොඩි කඩ කාමර සහ රත්මලාන පරණ ලොකු කඩ කාමර මේ වන විට වෙනත් ස්ථානයකට ගෙනගොස් තිබුණද එම කඩ කාමරවලින් අයවිය යුතු පෙර වර්ෂ හිඟ මුදල් රු.6,968,247 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රත්මලාන නව පොඩි කාමර හා පරණ ලොකු කඩ කාමර වලින් කොටසක් අය කර ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii | මුද්‍රා තබා ඇති කඩ කාමරවලට අමතරව කඩ කාමර 40 කින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු කුලියක් අය වී නොතිබුණි. | භෞතික අඩුපාඩු හේතුවෙන් හෝ කුලිය වැඩිකිරීම සම්බන්ධයෙන් බදුකරුවන් විරෝධතාව පල කර ඇති අතර, අලුත්වැඩියා කළහොත් ගිවිසුම්ගත වන බවත් අලුත්වැඩියා සිදු කිරීම ඵලදායී නොවන බවත්, ඉදිරියේදී සංවර්ධන කටයුතු කරන බවත් සභාව විසින් දන්වා ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | දේපළ කුලී<br>------------- | | |
| i | 2020 දෙසැම්බර් 31 දිනට දේපළ 14 කින් අයවිය යුතු හිඟ දේපළ කුලිය රු.5,778,407 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. කොවිඩ් 19 නිසා තරමක ප්‍රමාදයක් සිදු විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | බලපත්‍ර ගාස්තු<br>----------------- | | |
| | ලේඛන අනුව 2020 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කළයුතු වෙළඳසැල් 1793 ක් පවතින බව දක්වා තිබුණද වෙළඳසැල් 500 ක් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර තිබූ අතර වෙළඳසැල් 1293 ක් බලපත්‍ර ලබා නොගෙන එනම් බලපත්‍ර ගාස්තු ගෙවීමෙන් තොරව ව්‍යාපාර කටයුතු සිදුකර තිබුණි. | ගැසට් නිවේදනයේ පරිදි කර්මාන්ත බදු සඳහා ගාස්තු අය නොකරන ලද අතර, ඒවා බලපත්‍ර ලබා ගත යුතු ස්ථාන ලෙස ලේඛණ ගත වී ඇත. නමුත් 2021 වසරේ දී ගැසට් පත්‍රය නිවැරදි කර ඇත. ගාස්තු අය කිරීම ඒ අනුව සිදු වේ. | බලපත්‍ර නිකුත් කළයුතු වෙළඳසැල් හඳුනාගෙන බලපත්‍ර නිකුත් කළ යුතුය. |

(ඉ) උසාවි දඩ

| | | |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාළව අධිකරණ මඟින් අය කරගන්නා ලද උසාවි දඩ මුදල් වටිනාකම රු.84,140,132 ක් වුවද එය සමාලෝචිත වර්ෂය තුළදීද අදාළ ආයතනවලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයට අදාළ උසාවි දඩ මුදල් සඳහා උපලේඛණ පිළියෙල කර ඇත. 2019 වර්ෂයේ උපලේඛණ පිළියෙල කරමින් පවතින අතර 2020 වර්ෂයට අදාළ උපලේඛණ පිළියෙල කිරීමට කෝවිඩ් 19 වසංගත තත්වය හමුවේ උසාවිය වෙත යාමට නොහැකි තත්වයක් ඇත. | ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.3,563,042 ක් අයකර ගැනීමට තිබුණි. | අදහස් දක්වා නොමැත. | අධිභාර ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## **3.1** හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 නොවැම්බර් 18 දින සිදු කරන ලද රු.145,470 ක වරිපනම් බදු මූල්‍යමය වංචාව සම්බන්ධයෙන් අලාභය අයකර ගැනීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් විනය පරීක්ෂණයට අදාළව පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර රටේ පවතින වාතාවරණය අනුව එම පරීක්ෂණය මෙතෙක් ආරම්භ කර නොමැත. | පරීක්ෂණ කටයුතු නොපමාව නිම කර අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනගාරික ධර්මපාල මාවතේ අංක 14 ස්ථානයේ පිහිටි නිල නිවසෙහි, 2009 හා 2010 වර්ෂයන්ට අදාළ හිඟ ජල බිල්පත වෙනුවෙන් රු.87,844 ක් 2016 සැප්තැම්බර් 05 දින සභාව විසින් ගෙවා තිබුණි. එම හිඟ ජල බිල්පත් ගාස්තුව එම කාලයේ නිවසේ පදිංචිව සිටි නිළධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගන්නා ලෙස 2018 සැප්තැම්බර් 4 දිනැති ලිපියෙන් දක්වා තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මේ සඳහා විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු ආරම්භ කිරීම සඳහා විනය බලධරියා වන පළාත් පාලන කොමසාරිස් වෙත තොරතුරු ඉදිරිපත් කර ඇත. | අයකරගත යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.25,751,793 ක වියදමක් දරා දෙහිවල මංසන්ධියේ ඉදිකර තිබූ කඩකාමර 25 ක් බදුකරුවන් වෙත ලබා දී සමාලෝචිත වර්ෂයේ කුලී අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | විදුලිය හා ජල සම්බන්ධතාව එක් එක් කඩ කාමරය තුළට ලබා දී නොතිබුණු බැවින් බදු දී නොමැත. සම්බන්ධතාව ලබා ගැනීමට ආයතන දැනුවත් කර ඇත. | කුලි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගල්කිස්ස හෝටල් පාරේ අංක 4/89 දරන බිම් සැලැස්මේ රූඩ් 01 පර්චස් 4.10 ක් වූ ඉඩම වාහන නැවතුම් පොළක් ලෙස භාවිතා කිරීම සඳහා ගල්කිස්ස හෝටලය වෙත බදු දී තිබුණි. නගර සභාව සතු මෙම දේපළ බදු දීමේදී ගිවිසුම්වල පවත්නා අඩුපාඩු හේතුකොට ගෙන 2020 දෙසැම්බර් 31 දින වන විට මෙම දේපළේ හිඟ කුලිය රු.4,636,516 ක් වී තිබුණ අතර එම කුලි මුදල් බදුකරුගෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | වර්ෂ ගණනාවකට පෙර එළඹ ඇති ගිවිසුම 2020.05.31 දින ගිවිසුම් කාලය අවසන් බව ගල්කිස්ස හෝටලය වෙත ලිඛිතව දන්වා ඇත. එබැවින් නව තක්සේරු වටිනාකම තක්සේරු කරමින් පවතී. | අයවිය යුතු මුදල් අයකර ගැනීම කඩිනම් කළ යුතුවේ. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙහිවල එස් ද එස්.ජයසිංහ ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය ඉදි කිරීමේදී කොන්ත්‍රාත් සමාගම වෙත රු.20,784,031 ක් ගෙවා තිබුණද කළ වැඩ ප්‍රමාණයට අදාළ ගෙවීම් විස්තර හා ගිණුම් වාර්තා උපදේශන ආයතනය විසින් සභාව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර 2020 දෙසැම්බර් 31 දින වන විටද අදාළ ව්‍යාපෘතියේ වැඩ නිම කිරීමෙන් තොරව අතරමඟ නතර කර තිබුණි. | උද්ගතවූ කොරෝනා වසංගතය හේතුවෙන් 2020.03.16 සිට 2020.06.28 දක්වා කාලය තුළ රට අකර්මණ්‍ය වූ බැවින් රාජ්‍ය ආයතන වල රාජකාරී ඉටු කිරීම අතපසු විය. ප්‍රධාන නීති නිළධාරීගෙන්ද උපදෙස් ලබාගෙන ව්‍යාපෘතිය කඩනමින් නිම කිරීම සඳහා සාකච්ඡා කරමින් පවතී. | ව්‍යාපෘතියේ වැඩ අප්‍රමාදව නිම කළ යුතුය. |